# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2047/42 - 2017 නොවැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2017.11.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/2014/එච්ඩබ්ලිව්/405.
*මගේ අංකය* : එම්එල්බී/එල්එන්ඩී/එල්එන්ඩීඒකිව්/එල්1/39-6-i.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළය සහ ගඟබඩ පත්තුව සුළු කොට්ඨාසවල, ගල්පමුණ(402බී) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගල්පමුණ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට මාතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සකස් කරන ලද මූලික පිඹුරු අංක මාර 2694 හි කැබලි අංක 01 සඳහා ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0034 ක් වූ කැබැල්ල:

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: බාන්වැල්කොස්ඉදුව; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවුරුදු 5-15 පමණ වයසැති කොස් ගස් 4 ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පාලටුව, ගල්පමුණ, කොස්ඉන්දුව,'චරිත', පී.එස්.ලීලසේන; ප්‍රමාණය: හෙක්. 0.0034.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2017.12.11 දින පූ.භා. 10.00ට මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ මා සම්මුඛ විය යුතුයි.

තවද 2017.12.04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
මාලිම්බඩ.

2017 ක් වූ නොවැම්බර් මස 22 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මාලිම්බඩ.

12-464